ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

**සියවසකට වඩා පැරණි ජනාකීර්ණ නිවාස සහ වෙළ දසැල් නවීකරණය කරමින්**

**ටාටා හවුසින් සමාගම One Colombo ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියර සම්පූර්ණ කරයි;**

**ප්‍රතිලාභී පවුල් 740 ක් : රුපියල් මිලියන 7000 ක ආයෝජනයක්**

කොම්පඤ්ඤ වීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ඉදිකළ නාගරික නිවාස ඊයේ දින ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා අතින් ජනතා අයිතියට පත් කෙරිණ. මහ නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය ගරු රවි කරුණානායක මැතිතුමා, ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් ගරු තරංජිත් සිං සන්ධු මැතිතුමා, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මුජිබුර් රහුමාන් මැතිතුමා, ටාටා හවුසින් සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී සංජේ දත් මහතා සහ තවත් සම්භාවනීය අමුත්තන් රැසක් මෙම අවස්ථාවට සහභාගී විය. මෙහිදී සියලු නවීන පහසුකම් වලින් සමන්විත අංග සම්පූර්ණ නිවාස පවුල් 626 ක් වෙතද මනා ලෙස ඉදි කරන ලද වෙළ ද සැල් වෙළඳ සැල් හිමියන් 114 ක් වෙතද බාර දෙන ලදී. මේ සඳහා සිදු කරන ලද ආයෝජනය රුපියල් මිලියන 7000 ක් පමණ වේ. මෙය ටාටා හවුසින් සමාගම විසින් සිදු කරන ලද සුවිශේෂී ව්‍යාපෘතියක් වන අතර එමගින් ප්‍රදේශයේ දැනටමත් ජීවත් වන ජනතාව, වැඩිදියුණු කරන

ලද යටිතල පහසුකම් වලින් සමන්විත නිවාස සංකීර්ණයක නැවත පදිංචි කරන ලදී.

උත්සව සභාව ඇමතූ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා දිගු කාලයක් පුරා ඉන්දීය රජය විසින් ලබා දෙන සංවර්ධන සහයෝගීතාවය සම්බන්ධයෙන් සිය ස්තුතිය පළ කළේය. පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරයෙන් අනතුරුව ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවට පැමිණි බවද එම සංචාරය ශ්‍රී ලංකාව පිළිබ ද ජාත්‍යන්තර විශ්වාසය ඉහළ නැංවීමට විශාල ලෙස උපකාරී වූ බවද රනිල් වික්‍රමසිංහ මැතිතුමා විශේෂයෙන් සඳහන් කළේය. දෙරට අතර සම්බන්ධීතාවය සහ ජනතාව අතර පවතින බැඳීම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි එතුමා විශ්වාසය පළ කළේය.

ඉන්දීය මහ කොමසාරිස්තුමාද මෙම අවස්ථාව ඇමතූ අතර එතුමා මෙම ව්‍යාපෘතිය ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස නම් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා රජයට සිය ස්තුතිය පළ කළේය. මෙම ව්‍යාපෘතිය, ඉන්දියානු සමාගම් තුළ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබ ද පවතින විශ්වාසය පිළිඹිබු කෙරෙන තවත් එක් අවස්ථාවක් බව මහ කොමසාරිස්තුමා පෙන්වා දුන්නේය. ඉන්දියාව සහ ශ්‍රී ලංකාව වේගයෙන් නාගරීකරණය වෙමින් බවතින බව පැවසූ එතුමා දෙරටෙහි නගර, සියල්ලන්ම ඇතුළත් වන පරිදි සහ තිරසාර අයුරින් සුහුරු ලෙස සංවර්ධනය කිරීම වැදගත් වන බවද අවධාරණය කළේය.

ශ්‍රී ලංකාව තුළ ප්‍රචලිත නාමයක් වන ටාටා සමාගම ඇමරිකානු ඩොලර් බිලියන 100කට වැඩි වාර්ෂික ආදායමක් සහිත ලොව පුරා 100කට වැඩි රටවල් ගණනක ව්‍යාප්ත වී ඇති ගෝලීය සමාගමකි. 1961 වර්ෂයේ සිට ටාටා සමාගම ශ්‍රී ලංකාව තුළ ප්‍රවාහන, සන්නිවේදන සහ ආගන්තුක සත්කාර ආදි විවිධ ක්ෂේත්‍ර තුළ සිය ව්‍යාපාර කටයුතු සිදු කරයි.

*****

2019 අගෝස්තු 02

කොළඹ